**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 ව්‍යාපෘතිය - 2023**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3029 සහ 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ව්‍යාපෘති හා ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එ.ජ.ඩො.මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එ.ජ.ඩො. මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එ.ජ.ඩො. මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එ.ජ.ඩො. මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2024 පෙබරවාරි 29 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතිය ේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිනුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණන නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෘහස්ත ජල මනු මිලදී ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම වෙනුවෙන් ICB 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත රුපියල් මිලියන 870 ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල | 870 | මෙම ප්‍රවේශය දැනටමත් SCAPC කමිටුව විසින් කොන්ත්‍රාත් මිල වැඩිකිරීමේ අනුමත අදියරේදී සමාලෝචනය කර ඇති අතර කොන්ත්‍රාත් විෂය පථයෙන් පිටත ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා | ව්‍යාපෘති අරමුදල් නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ අරමුණු වලින් බැහැර වෙනත් කටයුතු සඳහා භාවිතා නොකළ යුතු අතර ගිණුම් දෝෂය නිවැරදි |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දැක්වීම වෙනුවට රජයේ දායකත්ව ගිණුමෙන් කපා හැර තිබුණි. | | අවශ්‍ය කැබිනට් අනුමැතිය සහිතව රජයේ ප්‍රතිපාදන හරහා ගෙවීමට නිර්දේශ කර ඇත. වර්තමානයේදී මේ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ කටයුතු කරගෙන යමින් පවතී. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු. මිලයන 1657.87 ක් වූ ජල සම්බන්ධතා ද්‍රව්‍ය සහ වටිනාකම රු. මිලියන 293.85 ක් වූ රසායනික ද්‍රව්‍ය, ව්‍යාපෘති අරමුදල් යොදා ගනිමින් මණ්ඩලයේ අවශ්‍යතාවන් සඳහා මිලදී ගෙන තිබූ අතර අදාළ වියදම් මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් ලෙස සටහන් කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘති වියදම් ලෙස සටහන් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස **ICB** 4 සහ **ICB** 3 කොන්ත්‍රාත්තුවල කෙරීගෙන යන වැඩ වල වටිනාකම පිළිවෙළින් රු. මිලියන 1657.87 කින් සහ රු. මිලියන 293.85 කින් අධිප්‍රමාණය වී තිබුණි. | 1,951.72 | මෙය දැනටමත් **SCAPC** කමිටුව විසින් කොන්ත්‍රාත් මිල වැඩි කිරීමේ අනුමත අදියරේදී සමාලෝචනය කර ඇති අතර කොන්ත්‍රාත් විෂය පථයෙන් පිටත ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය සහිතව රජයේ ප්‍රතිපාදන හරහා ගෙවීමට නිර්දේශ කර ඇත. වර්ථමානයේ මේ පිළිබඳව අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ කටයුතු කරගෙන යමින් පවතී. | ව්‍යාපෘතියේ විෂය පථය තුළ ව්‍යාපෘති අරමුදල් භාවිතා කිරීමට විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර විශේෂ අවශ්‍යතාවයකදී අරමුදල් ලබා ගැනීමට පෙර අදාළ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රතිපාදන හා වියපැහැදම් කාලසීමාව අවසන් වූ වෙනත් ව්‍යාපෘතියකට (ණය අංක 2948-**SRI)** අදාලව කරන ලද වියදම් පියවීම සඳහා රු. මිලියන 12.3 ක ව්‍යාපෘති අරමුදල් භාවිතා කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2023 ජනවාරි 3 වැනි දින ලබා දුන් ලිඛිත උපදෙස් පරිදි **ICB** 03 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරු (චයිනා හාබර් ඉංජිනියරින් - චයිනා ජියෝ කෝපරේෂන් ජොයින්ට් වෙන්චර්) විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බැංකු ගිණුමට රු. මිලියන 10.7 ක මුදලක් තැන්පත් කර තිබුණි. මණ්ඩලය විසින් එම තැන්පත් මුදල භාවිතා කර ඉහත සඳහන් කළ අනෙක් ව්‍යාපෘතියේ උපයෝජනය නොකළ අත්තිකාරම් ශේෂය වූ ඇ.ඩොලර් 28,543 ක් නැවත පියවීමට යොදා ගෙන තිබුණි. | 12.3 | ආසියානු සංවර්ධන බැංකුව විසින් ණය අංක 2948-**SRI** හි උපයෝජනය නොකළ අත්තිකාරම් ඇ.ඩොලර් 28,543.22 ආපසු ගෙවීම ඉල්ලා සිටි අවස්ථාවේ ව්‍යාපෘති කළමනාකරණය විසින් මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය) වෙතින් මේ සඳහා අරමුදල් ව්‍යාපෘතියේ රාජ්‍ය ප්‍රතිපාදන මඟින් හෝ මණ්ඩලයේ අරමුදල් මඟින් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. කෙසේ නමුත් ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය ප්‍රතිපාදන හෝ මණ්ඩල අරමුදල් යන දෙකෙහිම ප්‍රතිපාදන නොතිබුණු බැවින්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ඇතිව, **ICB-**03 කොන්ත්‍රාත්කරු හරහා එම මුදල ආපසු ගෙවීමට සංවිධානය කරන ලදී. | ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘති අරමුදල් විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ අරමුණු හැර වෙනත් කටයුතු සඳහා භාවිතා නොකළ යුතු අතර ගිණුම් දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කොන්ත්‍රාත්තුවට අනුව, වෙන්කරන ලද අයිතම යටතේ ක්‍රියාත්මක කරන සියලුම වැඩ සඳහා කොන්ත්‍රාත්කරුගේ පොදු කාර්ය සහ ලාභය සඳහා සියයට 15 ගෙවීමට අවශ්‍ය වේ. | |
| (ඇ) | ඉහත ගනුදෙනුව පියවීම සඳහා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 1.6 ක කොමිස් මුදලක් ද ඇතුළුව රුපියල් මිලියන 12.3 ක් විචලතා නියෝගයක් හරහා ගෙවා තිබූ අතර එම මුදල ආසියානු සංවර්ධන බැංකු ණය සහ මෙම ව්‍යාපෘතියේ සිවිල් වැඩ වියදම් ලෙස ගිණුම්ගත කොට තිබුණි. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ ණය වටිනාකම සහ සිවිල් වැඩ ගිණුමේ වටිනාකම එම ප්‍රමාණයෙන් අධි ප්‍රමාණය වී තිබුණි. අවසානයේ, මණ්ඩලය වෙතින් ව්‍යාපෘතියට ලැබිය යුතු අරමුදල් ලෙස ගිණුම් තුල හඳුනාගනු වෙනුවට රජයේ දායකත්වයට එරෙහිව කෙරීගෙන යන සිවිල් වැඩ ගිණුමෙන් රුපියල් මිලියන 10.7 ක් කපා හැර තිබුණි. රුපියල් මිලියන 12.3 ක මුදල සාවද්‍ය ලෙස ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබුණද දෝෂය නිවැරදි කිරීමට කෙරීගෙන යන වැඩ ගිණුමට බැර කර තිබුණේ රුපියල් මිලියන 10.7ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ ගිණුම රු. මිලියන 1.6 කින් අධිප්‍රමාණය වී තිබුණි. තවද, මෙම ගණුදෙනුව හේතුවෙන් රුපියල් මිලියන 1.4 ක විදේශ විනිමය ලාභයක් ජල සම්පාදන මණ්ඩලය විසින් ලබාගෙන ඇති බවත්, එය මණ්ඩලය වෙතින් ව්‍යාපෘතියට ලැබිය යුතු අරමුදල් ලෙස හඳුනා නොගෙන මූල්‍ය ප්‍රකාශනවල විදේශ විනිමය පාඩුවක් ලෙස වැරදි ලෙස හඳුනාගෙන ඇති බවත් නිරීක්ෂණය විය. | එකඟවෙමි | දෝෂය නිවැරදි කිරීමට සහ අනාගතයේදී නිවැරදි ගිණුම් ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 6.99 ක පාරිතෝෂික ගෙවීම සැලකිල්ලට ගෙන නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ මුළු පාරිතෝෂික පිරිවැය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි. | 6.99 | එකඟ වේ. ඒ අනුව පාරිතෝෂික පිරිවැය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි ගිණුම් වාර්තා තබා ගැනීමට කටයුතු කළ යුතුය |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| අංකය | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 502(2). | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. ස්ථාවර වත්කම් හඳුනා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 128(1) ඉ,<br>507 සහ 756 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ප්‍රථම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ යුතු වුවද, 2024 මැයි 02 වැනි විගණන දිනය වන විටත් එය සිදු කර නොතිබුණි. | එකඟ වෙමි. මාසයක් ඇතුලත නිම කිරීමට සැලසුම් කර ඇත. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය**

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 03 දින සිය කටයුතු ආරම්භ කළ අතර මූලික ගිවිසුමට සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2019 ජූනි 30 වන විට කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වූ අතර 2024 පෙබරවාරි 29 දක්වා ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට සිදු විය. ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 100 සහ සියයට 84 ක් වී තිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ණය කාල සීමාව අවසන් දින වූ 2024 පෙබරවාරි 29 දිනට පෙර නිවාස සම්බන්ධතා මාරු කිරීම, පැරණි නල මාර්ග විසන්ධි කිරීම, මාර්ග ප්‍රතිස්ථාපන කටයුතු, නල සිතියම් කිරීම් කටයුතු සහ වත්කම් ප්‍රාග්ධනීකරණ කටයුතු වැනි ඉතිරිව ඇති වැඩ කටයුතු සිදු කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් දින දීර්ඝ කිරීමට කැබිනට් අනුමැතිය ලබා නොගෙන ව්‍යාපෘති කටයුතු | ව්‍යාපෘති ප්‍රමාදයන් සඳහා ප්‍රධාන වශයෙන් ICB-04 ක්‍රියාත්මක ප්‍රදේශයේ මාර්ග කැණීම සඳහා CMC අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වීමට හේතු විය. මෙයට එම ප්‍රදේශයේ මලාපවහන යටිතල පහසුකම් සැකසීම සඳහා කොළඹ මහ නගර සභාව විසින් තවත් සමාන්තර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබීම සහ කොළඹ මහ නගර සභාව විසින් මණ්ඩලය වෙත කොළඹ නගරයේ සියළුම | තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ රටට පාඩුවක් නොවන පරිදි ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි නිම කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිගින් දිගටම කරගෙන යන බව නිරීක්ෂණය විය. | මාර්ග එකවර කැණීම් කිරීමට අවසර නොදීම හේතු වී තිබුණි. | |
| (ආ) | ජල ප්‍රවාහ මිනුම් දත්ත රැස් කිරීම සඳහා ICB 03 කොන්ත්‍රාත්තුව යටතේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 19 ක් සඳහා ඇමරිකානු ඩොලර් 230,035 කට සමාන රු.මි.69 ට DMA මීටර් 19 ක් සවි කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත මීටර 19න් මීටර් 17ක්ම 2023 දෙසැම්බර් 31 වන විට අක්‍රියව පැවතුණි. එම මීටර වසර 3ක නිෂ්පාදන වගකීමක් සහිතව 2016 සහ 2017 යන වර්ෂවලදී මිල දී ගත් ඒවාවන අතර මිලදී ගත් දින සිට වසර දෙකකට පසු ස්ථාපනය කර තිබුණි. තවද එම මීටර් ස්ථාපනය කිරීමට පෙර මීටර් 16ක වගකීම් කාලය අවසන් වී ඇති බව නිරීක්ෂණය විය. | 2017 දී ප්‍රදානය කරන ලද ICB-03 සහ ICB 04 යන කොන්ත්‍රාත්වල ප්‍රසම්පාදන ප්‍රමාදයන් සිදුව තිබුණි. එබැවින් ICB-03 සහ 04 හි DMA මීටර් සවි කිරීම ප්‍රමාද විය. වගකීම් කාලය දීර්ඝ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු (එනම් සැපයුම්කරු) සමඟ සාකච්ඡාවට කිහිපයක් සංවිධානය කර තිබුණි. | මෙම ප්‍රසම්පාදනයේ අසාර්ථකත්වයන්ට කළමනාකාරිත්වය වගකිව යුතු අතර පවතින ගැටළු නිවැරදි කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | ආදායම් නොවන ජල කළමනාකරණය සඳහා ජල ප්‍රවාහ දත්ත ලබා ගැනීමට ICB 04 කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23 ක (DMAs) ඇ.ඩොලර් 246,337.80 (වත්මන් වටිනාකම දළ වශයෙන් රු.මිලියන.73.9) වටිනා DMA මීටර 23 ක් ස්ථාපිත කර ඇත. කෙසේ වෙතත්, 2024 මැයි 02 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී එම සියලු මීටර දෝෂ සහිත බවත්, 2021 වසරේ සිට සමහර මීටර් අක්‍රියව පවතින බවත් නිරීක්ෂණය විය. | ප්‍රධාන වශයෙන් බැටරි ආයු කාලය ඉක්මවා යාම හේතුවෙන් ප්‍රවාහ දත්ත මීටර හරහා ආදායම් නොවන ජල පාලන මැදිරිය දක්වා යැවිය නොහැකි වේ. එබැවින්, ABB නිර්දේශිත දේශීය නියෝජිතයා හරහා බැටරි ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | පවතින ගැටලු නිවැරැදි කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | ආදායම් නොවන ජල කළමනාකරණ මෘදුකාංග, සියලුම වර්ගයේ තොග ජල මීටර, සර්වර්, යූ.පී.එස් පද්ධතිය, ඒසී ඒකක, මොනිටර්ස් ඩිස්ප්ලේ වැනි යාන්ත්‍රික සහ විදුලි උපකරණ සඳහා බලයලත් දේශීය නියෝජිතයන්ගෙන් ලබාගත් වගකීම් සහතික සහ ලිපි මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාරදී නොතිබුණි. | මෙහෙයුම් හා නඩත්තු අංශය විසින් ආදයම් නොවන ජල පාලන මැදිරිය 2022 වර්ෂය සිට ව්‍යාපෘතිය හරහා සපයන ලද සියළු පහසුකම් සහිතව භාවිතා කර ඇත. අවශ්‍ය සියලුම ලියකියවිලි දැනටමත් මෙහෙයුම් හා නඩත්තු වෙත භාර දී ඇත. | ඉතිරි විදුලි උපකරණ තවදුරටත් ප්‍රමාදයකින් තොරව භාරදීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) | ICB 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කටයුතු සඳහා ආනයනය කර තිබූ රුපියල් මිලියන 51.36 (ආසන්න වශයෙන්) වටිනාකමින් යුත් “NWS&DB” ලෙස සංකේතවත් කරන ලද Ningbo වර්ගයේ ගෘහස්ත ජල මීටර් 6548 ක තොගයක් කොන්ත්‍රාත්කරු භාරයේ තිබියදී 2023 වර්ෂයේදී අස්ථාන ගත වී තිබුණි. මේ අතරතුර, ඉහත මීටර් තොගයෙන් මීටර් 913 ක් පෞද්ගලික වෙළෙඳ ආයතනයක විකිණීමට තබා තිබියදී සොයා ගන්නා ලදී. | කොන්ත්‍රාත්තුවට අනුව, ගබඩා පහසුකම නඩත්තු කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි. ගැටළුව හඳුනා ගත් විට ද්‍රව්‍යමය අලාභයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ව්‍යාපෘති කළමනාකරු මෙන්ම මණ්ඩලයෙහි අභ්‍යන්තර විගණන අංශය විසින් ආරම්භ කරන ලදී. සාකච්ඡා ගණනාවකට පසු අහිමි වූ ජල මීටර සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වූ අතර කොන්ත්‍රාත්කරු විසින් යම් ද්‍රව්‍යමය අලාභයක් සිදු වුවහොත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව ඔවුන්ගේ අවසාන | අනාගතයේදී සිදුවන වංචනික ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සඳහා තොග සම්බන්ධයෙන් දැඩි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු අතර මෙම වංචාව හේතුවෙන් සිදු වූ පාඩු වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉහත අලාභ හා වංචා සිදුවී වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් එම පාඩු අයකර ගැනීමට හෝ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීමට ව්‍යාපෘති කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | බිල්පතෙන් අඩු කරන බව දැනටමත් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. | |

## 3.3 ව්‍යාපෘති අරමුණු වලින් බාහිරව සිදු කරන ලද ක්‍රියාකාරකම්/ගෙවීම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ අරමුණු උල්ලංඝනය කරමින් ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍ය ගෘහස්ත ජල මීටර 122,500ක් සහ Gunmetal ferrules 100,000 ක් මිලදී ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම වෙනුවෙන් ICB 3 කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 870 ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි. මෙයට අමතරව තවත් සියයට 15 ක් හෙවත් රු.මිලියන 254 ක්, ඉහත සැපයුම් සඳහා නිසි අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුගේ ලාභය සහ පොදු කාර්ය වියදම් වශයෙන් ගෙවා තිබුණි. | 2022 වර්ෂයේදී පැවති විදේශ විනිමය අර්බුදය අතරතුර, ජල මීටර, රසායනික ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවට ණයවර ලිපි විවෘත කිරීමට මණ්ඩලයට අපහසු විය. මෙම අර්බුදය කළමනාකරණය කිරීම සඳහා ජල සම්පාදන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ICB - 03 සහ ICB-04 කොන්ත්‍රාත්කරුවන් හරහා ප්‍රසම්පාදනය සිදු කිරීමට මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී උපදෙස් දෙන ලදී. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති අරමුදල් යෙදවිය යුතු අතර දැනටමත් වෙනත් අරමුණු සඳහා භාවිත කර ඇති මුදල් ආපසු ගෙවිය යුතුය. |
| (ආ) | මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතියේ 01 හි ඇ.ඩොලර් 28,543.22 ක උපයෝජනය නොකල ණය අත්තිකාරම් ආපසු ගෙවීම සඳහා ජල සම්පාදන මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ICB 3 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරු හරහා ආසියානු සංවර්ධන බැංකුව වෙත රුපියල් මිලියන 9.2 ක් ගෙවා ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු එම ගෙවීම සහ රු.මි. 1.6 ක සියයට 15 ට සමාන ලාභය සහ පොදු කාර්ය වියදම් සඳහා වෙන් කිරීම් ඇතුළුව අන්තර් ගෙවීම් බිල්පතට ඇතුළත් කර ව්‍යාපෘතිය 02 න් ලබා ගෙන තිබුණි. තවද මෙම ගණුදෙනුව හරහා රු. මිලියන 1.45 ක විදේශ විනිමය හුවමාරු ලාභයක් ජල සම්පාදන මණ්ඩලය ලබාගෙන ඇති බවද නිරීක්ෂණය විය. | ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදුන් අංක 2948-SRI ණයට අදාලව උපයෝජනය නොකල ඇ.ඩොලර් 28,543.22 ක ආපසු ගෙවීම ඉල්ලා සිටි විට ඒ සඳහා අරමුදල් ව්‍යාපෘතියෙන් හෝ මණ්ඩලයේ අරමුදල් මඟින් ලබා දෙන ලෙස මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (මුදල්) ගෙන් ඉල්ලීම් කරන ලදී. කෙසේ වෙතත්, එම අරමුදල් රජයේ සහ මණ්ඩල අරමුදල් දෙකෙහිම නොතිබුණි. එබැවින්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී අනුමැතිය ඇතිව, ICB-03 කොන්ත්‍රාත්කරු හරහා ආපසු ගෙවීම සංවිධානය කරන ලදී. කොන්ත්‍රාත්තුවට අනුව, වෙන් කිරීමේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන සියලුම වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට පොදු කාර්ය සහ ලාභය සඳහා 15% ගෙවීමට අවශ්‍ය වේ. | ව්‍යාපෘතියේ අරමුදල් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොද ගත යුතු අතර ව්‍යාපෘතියේ අමතරව යොදවා ඇති අරමුදල් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. . |

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියට DMA මීටර් මිලදී ගැනීමේදී මණ්ඩලය සහ DMA මීටර් සැපයුම්කරු අතර අත්සන් කර ඇති ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි අනුව සැපයිය යුතු ඉලොක්ට්‍රෝමැග්නටික් තොග ජලමනු එක්සත් රාජධානියේ නිෂ්පාදිත ඒවා විය යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය විසින් චීනයේ නිෂ්පාදිත DMA මීටර් මිලදී ගෙන ඇති බව නිරීක්ෂණය විය.<br>- ඉහත ගිවිසුමට අනුව, තෝරාගත් සැපයුම්කරු DMA මීටර් සඳහා නිෂ්පාදකයා විසින් නම් කරන ලද බලයලත් දේශීය නියෝජිතයා ලෙස සඳහන් කර ඇත. කෙසේ වෙතත්, අදාල නියෝජිතායතනය සහ ව්‍යාපෘතිය යන දෙපාර්ශවය අතර වලංගු ගිවිසුමක් විගණනයට ඉදිරිපත් කිරීමට ව්‍යාපෘතිය අපොහොසත් විය.<br>- කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති නිෂ්පාදන වගකීම් සහතිකයට අනුව, DMA මීටර නිෂ්පාදකයා වසර 5ක වගකීම් කාලයක් ලබා දීමට එකඟ වී ඇතත්, බෙදා හැරීමේ දින සිට වසර 3ක වගකීම් කාලයක් පමණක් ලබා ගැනීමට ව්‍යාපෘතිය එකඟ වී ඇත.<br><br>- | ටෙන්ඩර් ඉදිරිපත් කිරීම අනුව, ප්‍රවාහ මීටර එක්සත් රාජධානියේ නිෂ්පාදනය කර චීනයෙන් ක්‍රමාංකනය කර නැව්ගත කරන බව සැපයුම්කරු තහවුරු කර ඇත.<br>දේශීය නියෝජිතයාගේ සේවය අවශ්‍ය වන්නේ කොන්ත්‍රාත්තුව අවසානයේ, මීටර් සපයා සහ ඒවා ස්ථාපනය කිරීමෙන් පසුව පමණි. ඒ අනුව, දේශීය නියෝජිතයාගේ සේවය සොයා බැලූ නමුත් ලංසු තැබීමේ අදියරේදී නිෂ්පාදනය යෝජිත දේශීය සමාගම සොයා ගැනීමට නොහැකි වූ අතර පසුව නිෂ්පාදකයාගේ ප්‍රාදේශීය කාර්යාලයේ අනුමැතිය ඇතිව සැපයුම්කරු විසින් නව දේශීය නියෝජිතයෙකු යෝජනා කළේය. ඒ අනුව, නව දේශීය නියෝජිතයා විසින් සේවා ගිවිසුම සකස් කර ඔවුන්ගේ සමාලෝචනය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත ඉදිරිපත් කර ඇත.<br>2014 දෙසැම්බර් 25 දිනැති නිෂ්පාදකයාගේ වගකීම් ලිපියට අනුව නිෂ්පාදකයාගේ ලිපියෙන් මාස හයක් ඇතුළත ලැබුණු ඇණවුම තහවුරු කළහොත් වගකීම් කාලය වසර පහක් දක්වා දීර්ඝ කළ හැකි බව සඳහන් වේ. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව 2015 සැප්තැම්බර් 03 වන දින ප්‍රදානය කරනු ලැබූ අතර එනම් මාස 9 කට පසුවය. එබැවින් වගකීම් කාලය වසර තුනක් ලෙස පවතී. | ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි දැඩි ලෙස අනුගමනය කළ යුතු අතර මෙම ප්‍රසම්පාදනයේ සැබෑ තත්ත්වය හෙළිදරව් කිරීම සඳහා විමර්ශනයක් කළ යුතුය. |

## 3.5 නිෂ්ක්‍රිය / භාවිතයට නොගත් / ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ පුහුණු හා සංවර්ධන ධාරිතා වැඩිදියුණු කිරීමේ යෝජනාව යටතේ රු. මිලියන 1,571 ක වියදමකින් මණ්ඩලයේ අභ්‍යන්තර අවශ්‍යතා සඳහා පමණක් නොව වාණිජ පදනම මත බාහිර ක්‍රියාකාරකම් සඳහාද යොදාගත හැකි වන පරිදි තෙලවල පුහුණු මධ්‍යස්ථානය (CEWAS) ඉදිකොට තිබුණු අතර 2022 | මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය මගින් තෙලවල පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කර මණ්ඩලය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා 2022 දෙසැම්බර් මස භාර දී තිබුණි . | මෙම ඉදිකිරීම් සඳහා වැය වූ මුදලට සරිලන වටිනාකමක් ලබා ගැනීම සඳහා මුළු වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 16 දින සිට මණ්ඩලයේ නිළධාරීන් යොදාගනිමින් එහි ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණි. 2023 වර්ෂය තුළ එහි නඩත්තුව සඳහා රුපියල් මිලියන 41.63 ක් පමණ වැය කර තිබූ අතර මුළු ආදායම රුපියල් මිලියන 27.28 ක් විය. ඒ අනුව එම කාලය තුළ පාඩුව රුපියල් මිලියන 14.35 කි. තවද, රුපියල් මිලියන 7.22ක කාර්යාල උපකරණ වලින් යුත් වර්ග මීටර් 337.5ක අංගසම්පූර්ණ කාර්යාල පරිශ්‍රය, පරිගණක විද්‍යාගාර 2 ක්, ගෘහභාණ්ඩ සහිත පුස්ථකාල පරිශ්‍රයක් හා රුපියල් මිලියන 4.1 ක ව්‍යායාම උපකරණ සමඟ ව්‍යායාම් ශාලාවක් විවෘත කළ දින සිට කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව අක්‍රියව පවතී. | පුහුණු මධ්‍යස්ථානයේ (CEWAS) මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සඳහා මණ්ඩලය විසින් විවිධ ඒකක පිහිටුවා ඇත. මෙම විමසුමේ දක්වා ඇති ආදායම් සහ වියදම් ප්‍රමාණයන් පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාකාරිත්වය සඳහා පිහිටුවා ඇති ඉහත සඳහන් කරන ලද ඒකකය සමඟ පරීක්ෂා කළ යුතුය. | |
| (ආ) | ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 ට වඩා අඩුකර වඩා හොඳ ජල සම්පාදන සේවාවන් ඵලදායී ලෙස ලබාදීමේ අරමුණින් ව්‍යාපෘතිය - 02 ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කර මාස 111ක් ගතවී ඇතත්, ඩීඑම්ඒ 42 න් ඩීඑම්ඒ 25 ක් පමණක් සම්පූර්ණයෙන් නිම කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී ඇත. කෙසේ වෙතත්, රුපියල් මිලියන 4,293.25 ක් ණය ආපසු ගෙවීම් කර ඇති අතර, 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් සහ පොලී ගාස්තු පිළිවෙලින් රුපියල් මිලියන 95.11ක් සහ රුපියල් මිලියන 1,852.47ක් රජය විසින් ගෙවා තිබුණි. | පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි නල සිතියම් කිරීම් නොමැති වීම, අනපේක්ෂිත වැඩබිම් තත්ත්වයන්, වැඩ කරන කාලය බොහෝ දුරට රාත්‍රී කාලයට සීමා වීම, අනුමැතිය ප්‍රමාද වීම, 2019 අප්‍රේල් මාසයේ බෝම්බ පිපිරීම් සහ ව්‍යාපෘති දිගුව සඳහා වසංගත තත්ත්වය බාධා කිරීම් වැනි පාලනය කළ නොහැකි කරුණු හේතු විය. | රටට තවදුරටත් මූල්‍ය බර පැටවීම වළක්වා ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කල යුතුය. |

**3.6** ව්‍යාපෘති පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අයිසීබී-4 කොන්ත්‍රාත්තුව යටතේ නිම කර කොළඹ මහ නගර සභාවට භාර දුන් මාර්ග සඳහා රුපියල් මිලියන 164.46 ක් වටිනා සුරැකුම්පත් තැන්පතුව නැවත අයකර ගැනීමට ව්‍යාපෘතිය මඟින් කටයුතු කර නොතිබුණි. | තැනපතු ලබාගැනීමට කටයුතු කර ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ආරක්ෂිත තැන්පතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කර අවුරුදු 2 ගතවී ඇතත් රු.මිලියන 14,599 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා නොතිබුණි. | එකඟ වෙමි. 2024 අවසන් වන විට ඉලක්ක කර ඇති කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් සම්පූර්ණ කළ පසු එය සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් විධිමත් ලෙස මණ්ඩලය වෙත පැවරීමට වහාම පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාර්ෂික අයවැය ඇස්තමේන්තුව යටතේ ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන සහ F.R. 66 ප්‍රතිපාදන මාරුකිරීම් සමග සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 312 ක ප්‍රතිපාදන වෙන් වූ අතර වර්ෂය තුළ දරන ලද වියදම රුපියල් මිලියන 478 කි. මේ අනුව, රු. මිලියන 166ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබුණි. | F.R 66 ප්‍රතිපාදන මාරුකිරීම සමඟ එකඟ වන අතර අපගේ වාර්තාවට අනුව දරන ලද වියදම රුපියල් මිලියන 372 කි. | ඵලදායී මූල්‍ය කළමනාකරණ මෙවලමක් ලෙස වාර්ෂික අයවැය භාවිතා කළ යුතුය. |